විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 5/2015(1)

මාගේ අංක විවැ/චක්‍රලේඛ 2015
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාලිගාවත්ත,
කොළඹ 10.
2015/7/ 21

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් ,
සියලුම ප්‍රාදේශීය ලේකම්රුන් වෙත.

## රා.ප.ච.6/2006 ට අනුව විශ්‍රාම වැටුප් ගැලපීම (2015)

උක්ත කරුණ සම්බන්ධව 2015/07/06 දිනැති අංක 5/2015 විශ්‍රාම වැටුප් චක්‍ර ලේඛනය සමඟ නිකුත් කල උපදෙස් මාලාවට අමතරව වශයෙන් මේ සමඟ අමුණා ඇති උපදෙස් නිකුත් කරන බව දන්වමි.

එස්.එස්.හෙට්ටිආරච්චි
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්
1. ජනාධිපති ලේකම් - කාරුණික දැන ගැනීම සඳහා
2. අග්‍රාමාත්‍ය ලේකම් - කාරුණික දැන ගැනීම සඳහා
3. ලේකම් ,රාජ්‍ය පරිපාලන, පළාත්පාලන හා ප්‍රජාතාන්ත්‍රික පාලනය පිළිබඳ අමාත්‍යාංශය - කාරුණික දැන ගැනීම සඳහා
4. ලේකම්, ස්වදේශකටයුතු අමාත්‍යාංශය- කාරුණික දැන ගැනීම සඳහා
5. ලේකම් , මුදල් අමාත්‍යාංශය - කාරුණික දැන ගැනීම සඳහා
6. විගණකාධිපති - අ.ක.ස

**<u>රා.ප.ච. 6/2006 අනුව විශ්‍රාම වැටුප් ගැපීම (2015) උපදෙස්වලට අමතර වශයෙනි.</u>**

I. ජංගම ගිණුම් සඳහා ද විශ්‍රාම වැටුප් ගෙවීම් කටයුතු සිදු කල හැක.

II. යම් විශ්‍රාමිකයකුගේ විශ්‍රාම වැටුප ගණනය කිරීම නිවැරදි නම් සහ 6/2006 වැටුප් පරිවර්තනයෙන් පසු දීමනා ද ඇතුළත්ව මුළු වැටුප ලබමින් සිටි වැටුපට වඩා අඩු වන්නේ නම් ලබමින් සිටි වැටුප ලබා දිය යුතුය. එහිදී දීමනා නිවැරදි කිරීමටත් (3500+3525) මුළු මුදලේ අඩුවන ප්‍රමාණය පාඩු පිරිමැසීමේ ගෙවීමට දීමනාවක් ලෙස අමතරව වෙන්ව පෙන්වීමට කටයුතු කල යුතුය.

III. විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 2/2006 හා 2006.03.20 දිනැති චක්‍රලේඛ මඟින් විශ්‍රාම වැටුප් සංශෝධනය ට හිමිකම් ලැබූ සහ වසර 25 ක අවම සේවා කාලයකට හිමි කම් ලැබූ විශ්‍රාමිකයින් සඳහා පමණක් මෙම සංශෝධනයේ දි ද සේවා කාලය 25 ට අඩු අවස්ථාවල දි සේවා කාලය වසර 25 ක් සේ සලකා ප්‍රතිශතය ලබා ගැනීමට කටයුතු කළ යුතුය.(විනය හේතු මත, අකාර්යක්ෂමතාවය මත විශ්‍රාම ගිය අය සඳහා මෙම වාසිය ලබා දෙනු නොලැබේ).

IV. වැටුප් පරිවර්තනයේ දි 16/2015 රා.ප.ච. වැටුප් පරිමාණයන්ට ගලපා ගැනීමට නොහැකි තනතුරු සම්බන්ධයෙන් වැටුප් කොමිසමෙන් අවශ්‍ය උපදෙස් ලබා ගත හැක. දුරකථන අංක 011- 2669134හා 011-2676514 වේ.

V. විශ්‍රාම වැටුප සකස් කිරීමේ දී විශ්‍රාම වැටුප් සහිත දීමනාව සහ උපයාගත් වැටුප එකතු කර ගණනය කර ඇති විට අදාළ වැටුප් පරිමාණය සෙවීමේ දි එම දීමනාව සහ උපයාගත් වැටුප් වර්ධක කොටස අඩුකර වැටුප් පියවර සොයා ගත යුතුය. 6/2006 වැටුපට අනුරූප වැටුප ලබාගත් පසු විශ්‍රාම වැටුප් සහිත දීමනා පමණක් එම වැටුපට එකතුකර සංශෝධිත විශ්‍රාම වැටුප ගණනය කළ යුතුය.

VI. යම් විශ්‍රාමිකයෙකු වෙනත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලක් වෙත මාරු වී ගොස් ඇත්නම් අදාළ ලිපිගොනුව ද විශ්‍රාමිකයා මාරු වි යන ලද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට යැවීමට කටයුතු කරන්න.

VII. විෂමතා ඉවත් කිරීමට අදාල තොරතුරු පරිගණක ගත කළ පසු ගෙවීම් නිවැරදි බව නිර්දේශය කිරීම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරි විසින් සිදු කල යුතුය. ඒ සඳහා අවශ්‍යය පහසුකම් මධ්‍යගත දත්ත පද්ධතියේ සලසා ඇත.

VIII. ලිපි ගොනු ලබා ගැනීම, ගොනුව මඟින් තොරතුරු ලබා ගැනීම , සංශෝධිත වැටුපෙහි පිහිටුවීම, පරීක්ෂා කිරීම,පරිගණක ගත කිරීම සිදු කරනු ලබන කාර්යය මණ්ඩලය එම කාර්යයන් පිළිබඳව වාර්තාවක් තබා ගැනීමට කටයුතු කළ යුතුය.

එස්.එස්.හෙට්ටිආරච්චි
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්.